- **ප්‍රශ්න අංක 01 සිට 15 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. රි ග ම' ධ නි යන ස්වර විවාදි ස්වර වශයෙන් යොදාගන්නා රාගය වන්නේ,
   i. බිලාවල් ii. භෛරවි iii. භූපාලි iv. යමන්

2. <u>නි</u> ස <u>ග</u> ම ප <u>ධ</u> ප ම <u>ග</u> <u>රි</u> ස යන ස්වර සංගතිය අයත් රාගය වන්නේ,
   i. භෛරවි ii. බිලාවල් iii.යමන් iv. තාෆි

3. විකෘති ස්වර එකක් පමණක් යෙදෙන නිර්දේශිත රාගය
   i.තාෆි ii. භූපාලි iii. යමන් iv. භෛරවි

4. යමන් රාගය ආශ්‍රිත ගීතයකට නිදසුනක් ලෙස දැක්විය හැක්කේ,
   i.පාරමිතාබල පූජිත පූජිත ii. කවාලා විලද ජාති
   iii.කලිඳු ගංගා දෙණියේ iv. සාධූ දන්ත දා

5. භූපාලි රාගයේ සුවිශේෂී ලක්ෂණයක් වන්නේ,
   i. ම හා නි ස්වර වර්ජිත වීමයි.
   ii. ග හා නි වාදි සංවාදී වීමයි.
   iii. සම්පූර්ණ ජාති රාගයක් වීමයි.
   iv. දිනයේ ප්‍රථම ප්‍රහරයේ ගැයීමයි.

6. 4 වන මාත්‍රාවේ ඛලි ස්ථානය පිහිටන තාලය වන්නේ,
   i.ජප් තාලය ii. දීප්චන්දි තාලය
   iii.දාදරා තාලය iv. ත්‍රී තාලය

7. |දොං ජී | ජී ග ත | මෙම නිතට සමාන හින්දුස්තානී තාලය
   i.දාදරා ii. ත්‍රී තාල් iii. ජප්තාල් iv. දීප්චන්දි

8. හදේ කොතැනක හෝ හිදී ඔබ යන ගී පදය ගායනය සඳහා සුදුසු තාලය වන්නේ,
   i.දීප්චන්දි ii. ජප්තාලය iii. දාදරා තාලය iv.ත්‍රී තාලය

9. ග්‍රැමෆෝන් තැටි මගින් මුලින්ම ප්‍රචාරය වූ ගී විභේෂය වන්නේ,
   i.නූර්ති ගී ii.චිත්‍රපට ගී iii. හින්දි අනුකාරක ගී iv.ගැමි ගී

www.kedu.lk

10. ස්වාධීන තනු යුගයේ ග්‍රැමෆෝන් ගායකයින් ලෙස හැඳින්විය හැක්කේ,
    i. ආනන්ද සමරකෝන් මහතා
    ii. ඇනී බොතේජු මහතා
    iii. සුනිල් එදිරිසිංහ මහතා
    iv.රොමීලස් පෙරේරා මහතා

11. බටහිර සංගීත ප්‍රස්ථාර කරනයේ මාත්‍රා හයක වටිනාකමක් දැක්වීමට යොදාගතහැකි සංකේතය වන්නේ,

    i. 𝅗𝅥 ii. 𝅝 iii. 𝅝. iv. 𝅘𝅥

12. ස්වර ලිපි ලිවීමේදී ,4/4 ලෙස දැක්වෙන්නේ කුමන ස්වර ප්‍රස්ථාරයේද,
    i. |ස ප ප ප |ම ප ම ධ|ප - - -|ප ම ග රී|
    ii.|සගග මපප |ධ-ප ධම- |
    iii. |ගම රී |ග ප -| ධ- නී| ස රී ස|
    iv. |ගරී| මගරී| ස - |ධ නී ස|

13. නව නාට්‍ය ගීතයකට උදාහරණයක් නොවන ගීපාදය වන්නේ ,
    i. සෝභාව දේ මෙපුර
    ii. යස ඉසුරු පිරුණු තැනා
    iii. රත්නදීප ජන්ම භූමි
    iv. හෙළ ගැඹුරුයි පුන නොබලන්

14. ජන සංගීතයේ එන ගැමි ගී අතරත් සමාජ ගී ගනයට අයත් ගී විභේෂයට උදාහරණ වන්නේ,
    i. මේ කාගේ දොෙ කමතා
    ii. රන් දෑ කඅනි ගෙන
    iii. මේ වැල මොකදෝ - දම්වැල
    iv. මලේ මලේ අර නාමල

15. ගැමි ගීවල සුවිශේෂ ලක්ෂණයක් නොවන්නේ,
    i.සරල බස් වහර ii. ග්‍රන්ථාරූඩ කර තිබීම
    iii.මුඛ පරම්පරාවෙන් පැවත ඒම iv. අව්‍යාජ බව

ප්‍රශ්න අංක 16 සිට 25 දක්වා හිස්තැනට සුදුසු පිළිතුර ලියන්න.

a) සංගීතයේ භාවිතා වන ප්‍රකෘති ස්වර ගණන (16) ..... ක් වන අතර විකෘති ස්වර ගණන (17) ..... කි. මේ අනුව සංගීතයේ සම්පූර්ණ ස්වර ගණන (18).....කි.
b) බටහිර සංගීතයේ තීව්‍ර ස්වර දැක්වීම සඳහා(19)..... යන සංකේතයත්,කෝමල ස්වර දැක්වීම සඳහා (20)..... සංකේතයත් යොදාගනු ලබයි.
c) භෛරවී රාගයේ අනුවාදී ස්වර ලෙස (21)..... යන ස්වර වන අතර යමන් රාගයේ වාදී සංවාදී ස්වර පිළිවෙලින් (22)..... හා ..... ලෙස දැක්විය හැක.

www.lkedu.lk

d) ස්වර ලිපි පිවීමේදී |ස රි ග ම| ස රි ග ම |ආදී වශයෙන් විභාග දෙකෙහි ස්වර යෙදේ නම් දක්වන සංකේතය (23)..... ලෙසත්, ගී පාදයක් දෙවරක් වාදනය වන බව දැක්වීම සඳහා (24)..... යන සංකේතයක් යොදනු ලැබේ.

e) ඕළු නෙළුම් නෙරිය රඟාලා යන ගීතය (25)..... ලෙස දැක්විය හැකිය.

Ii කොටස

සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01).

i. නි ධ නි රි ග රි ස ලෙස ස්වර රාගය කුමක්ද?
ii. නිර්දේශිත රාග අතරින් රාත්‍රී ප්‍රථම ප්‍රහරයේ ගැයෙන රාගයක් නම් කරන්න.
iii. බටහිර සංගීතයට අනුව කෝමල රිෂභය දෙයාකාරයකින් දක්වන්න.
iv. ධ නි ස රි ග රි ස.. මෙ ම ස්වර අභ්‍යාසයෙහි මීලඟ පියවර දෙක ලියන්න.
v. බිලාවල් රාගයේ අනුවාදී ස්වර ලියන්න.
vi. ප්‍රස්ථාරකරණයේදී 0 සංකේතයෙන් අදහස් කරන්නේ කුමක්ද?
vii. කර්ණාටක සංගීත ආභාෂය ලද නාඨ්‍ය විශේෂය කුමක්ද?
viii. මහනුවර යුගයේ කවිකාරමඩුව ආශ්‍රිතව ගොඩනැගුන සංගීතයකට උදාහරණ දක්වන්න.
ix. ජන ගී ඇසුරින් නිර්මාණය කළ සරල ගීයක මුල් පේලිය ලියන්න.
x. දීප්චන්ද තාලයට සමාන දේශීය තිතට අයත් බෙර පදය ලියන්න.

02). හිස් තැනට සුදුසු පිළිතුරු වරහන් තුලින් තෝරා ලියන්න.

(ජසයා , කමන , සොකරි , පහතරට බෙරය , වෙස්මුහුණු)

උඩරට ප්‍රදේශයේ රඟ දැක්වූ ගැමි නාට්‍ය විශේෂය ..... වන අතර එම නාට්‍ය රඟ දක්වා ඇත්තේ ..... රංග භූමිය ලෙස යොදාගෙනය. පහතරට රඟදැක්වූ කෝළම් සම්ප්‍රදායේ විශේෂත්වය ලෙස ..... පැළඳීම දැක්විය හැකි අතර එහි එන චරිතයක් ලෙස ..... දැක්විය හැකිය. එහි ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය ..... යි.

03).

i. නිර්දේශිත රාග අතරින් ස්වර 12 ම යොදාගන්නා රාගය නම් කර, එම රාගයේ මධ්‍ය ලය ගීතයේ ස්ථායී කොටස ගීත ස්වර ප්‍රස්ථාර කරන්න.
ii. එම රාගයේ රාග විස්තර ලියන්න.
iii. එම රාගය ආශ්‍රිතව නිර්මාණය වී ඇති සරල ගීත දෙකක මුල් පද ලියන්න.
iv. ඔබ ලියූ රාගයට අදාල ස්වර සංගතියක් ලියන්න.

04.

i. පහත දැක්වෙන ස්වර ප්‍රස්ථාරය බටහිර සංගීත රේඛා මණ්ඩල මත ප්‍රස්ථාර කරන්න.
|ම ම ධ - |ප - - පධ |නි ධ ප ම| ගරිස -|
ii. ඉහත දී ඇති ප්‍රස්ථාරය මධ්‍යම භවයෙන් ලියන්න.

www.ikedu.lk

05. ශ්‍රී ලංකාවේ ග්‍රැමෆෝන් තැටි ගී පිළිබඳ පහත දැක්වෙන ශීර්ෂ ඔස්සේ බිත්ති පුවත්පතකට ලිපියක් ලියන්න.

i.ආරම්භය ii. ගීතවල සුවිශේෂතා iii.ගායක ගායිකාවන්

06. පහත දැක්වෙන මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. ශ්‍රී ලංකාවේ ගැමී ගී
ii. නූර්ති රංග සම්ප්‍රදාය
iii. වන්නම්
iv. ලක්ෂණ ගී
v. Repitation Mark

www.lkedu.lk